## සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ

## සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

### 01.හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022/12/14 දිනැති අංක. 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පටිපාටික රීති 1වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පටිපාටිය

### 02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

2.1 සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන්ගේ I,II,III ශ්‍රේණිවලට අයත් පහත සුදුසුකම් සපුරන නිලධාරීන්

කිසියම් වර්ෂයක දෙසැම්බර් 31 වන විට සහකාර හිමිකම් විමර්ශන නිලධාරී තනතුරෙහි එක් සේවා ස්ථානයක අවම වශයෙන් වසර 02ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබන අතර, වසර 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් ස්ථාන මාරු ලැබීමට යටත්වේ.

2.2 ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සපුරා තිබීම ස්ථාන මාරු ලැබීමට අනිවාර්ය සුදුසුකමකි.

2.3 තම සේවා කාලය තුළ මින් පෙර කිසිදු ස්ථාන මාරු වීමක් ලබා නොමැති නිලධාරීන් හට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

2.4 දුෂ්කර ස්ථානවල සේවයකරන නිලධාරීන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

<u>සටහන :</u>

**I.** ප්‍රියමනාප හා දුෂ්කර සේවා ස්ථාන ස්ථිර පදිංචිය තිබූ / ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර ප්‍රමාණය පදනම් කර ගෙන වර්ගීකරණය කරනු ලැබේ.

II. ප්‍රියමනාප සේවා ස්ථාන :-

ස්ථිර පදිංචිය තිබූ / ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර 30Km ක් හෝ ඊට අඩු නම් එම සේවා ස්ථානය ප්‍රියමනාප සේවා ස්ථානයක් වේ.

III. දුෂ්කර සේවා ස්ථානය :-

ස්ථිර පදිංචිය තිබූ / ඇති ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර 30Km ට වැඩි නම් එම සේවා ස්ථානය දුෂ්කර සේවා ස්ථානයක් වේ.

**03. ස්ථාන මාරු කමිටු**

1. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් (පාලන) - සභාපති

✷ 2. සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) - සාමාජික

3. සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන්ගේ අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් - සාමාජික

**04. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය**

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති අංක 254 අනුව ,

I සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සභාපති

II කොමසාරිස් ජනරාල් , ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නම් කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙක් - සාමාජික

✷ III කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - සාමාජික

**05. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේ දී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

5.1 පහත සඳහන් ස්ථාන මාරුවීම් අවස්ථා වාර්ෂික ස්ථාන මාරු වීම් කමිටුවේ විෂය පථයට ඇතුළත් නොවන අතර සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග ලබා දෙනු ලැබේ.

5.1.1 සේවා ස්ථානයේ වෙනසක් සිදු නොවන පරිදි කිසියම් රජයේ ආයතනයක සිදු කරන අභ්‍යන්තර අනුයුක්ත කිරීම්.

5.1.2 විනය නියෝගයක් මත හෝ විද්‍යානුකූල ක්‍රියාමාර්ගයක අවශ්‍යතාව මත හෝ කරනු ලබන මාරුවීම්.

5.1.3 සේවයේ අවශ්‍යතාව මත කරන මාරු වීම්.

5.1.4 නිලධාරීන්ගේ ඉල්ලීම මත සිදුවන සුහද ස්ථාන මාරුවීම්.

5.2 සේවා කාලය ගණනය කිරීමේදි එක් ප්‍රාදේශිය කාර්යාලයක් තුල අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාල වල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

5.3 යම් ස්ථානයක අවු.05ට වැඩි කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වන බැවින් තමන් අනුයුක්ත වීමට කැමති ස්ථාන 3ක් අයදුම්පත්‍රයෙහි පිළිවෙලින් සඳහන් කළ යුතුය. එහි සඳහන් ස්ථානයකට මාරුවීමක් ලබා දීමට උත්සහ දරන අතර, ඉල්ලා ඇති ස්ථානයකට ස්ථාන මාරුවීම ලබා දීමට නොහැකි වුවහොත් මාරුවීම් මණ්ඩලවල අභිමතය පරිදි ඔවුන්ට වෙනත් සේවා ස්ථාන ලබා දෙනු ඇත.

✷ <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනයට යටත්ව.</u>

5.4 දුෂ්කර හෝ ප්‍රියමනාප ස්ථානයක් වුවද වෙනත් ඉල්ලීම් නොමැති නම් නියමිත කාලයට වඩා වැඩි වුවද එම ස්ථානයේ සේවය කරන නිලධාරියාට තම කැමති නම් එහි සේවය කිරීමට ඉඩ දිය යුතුය.

5.5 දිස්ත්‍රික්කයක් ඇතුළත කුමන ප්‍රාදේශීය කාර්යාලයක හෝ සේවා කාලය එම දිස්ත්‍රික්කයේ මුළු සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

5.6 භාර්යාව හා ස්වාමිපුරුෂය යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම් අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබා දීමට සැමවිටම උත්සහ දැරිය යුතුය.

5.7 එක් එක් සේවා ස්ථානයකින් සේවා කාලය ගණනය කිරීමේදී නිලධාරියාගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

5.8 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සිටින නිලධාරීන්ට මුහුණ දීමට සිදුවන විසඳාගත නොහැකි ගැටළු වලදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද සමඟ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව සැලකිලිමත්වී කටයුතු කරනු ලැබේ.

5.9 ප්‍රියමනාප නොවන්නා වූ ප්‍රදේශ වල සේවය කරන නිලධාරීන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා , අවිවාහක නිලධාරීන්ද පාසල් යන නොමැති විවාහක නිලධාරීන්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

5.10 දරුවන් පාසල්වලට යැවීමේ කටයුතු වලට අවහිරයක් නොවනු පිණිස සෑම මාරුවීමක්ම හැකිතාක් දුරට ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

5.11 වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක. 2310/29 හා 2022/12/14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පරිපාටික රීති 251 හි III හි සඳහන් කරුණු ද සැලකිල්ලට ගෙන මෙම මාරුවීම් පටිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ.

5.12 නිලධාරියකු විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව ස්ථාන මාරුවීමක් ලබා දී ඇති විටෙක එම නිලධාරියා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කිරීම සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇති විට, අභියාචනා කමිටුව විසින් (ඉතාම සාධාරණ ඉල්ලීමක් හැර) ස්ථාන මාරුව යම්කිසි කාලයකට තාවකාලිකව දීර්ඝ කර ඇතිවිට එම සීමාව ඉක්ම වූ වහාම ස්ථාන මාරුව ක්‍රියාත්මක කළයුතුවේ.

5.13 දැනට සේවය කරන රාජකාරී ස්ථානයේ නියමිත සේවා කාලය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරු වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. දැනට සේවය කරන ස්ථානයේ නියමිත සම්පූර්ණ කර ඇති නිලධාරීන්සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතුය. උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

5.14 වෘත්තීය සංගමයේ ප්‍රධාන නිලතල උසුලන නිලධාරින් සඳහා එම සංගමයේ වැඩ කටයුතු වලට බාධාවක් නොවන පරිදි ඔවුන්ගේ සේවය සැපයිය හැකි වන පරිදි ස්ථාන මාරුවීම් ලබා දිය යුතුය. එසේම යම් නිලධාරියෙකු එම නිලතල වලින් ගිලිහුණු විට හෝ ඉහළ තනතුරකට, පංතියකට නැතහොත් ශ්‍රේණියකට උසස් වූ විට හෝ ඒ නිලධාරියා සාමාන්‍ය ව්‍යවස්ථා යටතේ මාරු කිරීමට යටත් වන්නේය. සෑම විටම මෙම අනුග්‍රහය දිය යුත්තේ සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට හා විනය පිළිබඳව වූ නියමයන්ට යටත්වය.

## 06. වාර්ෂික ස්ථාන මාරු කාලසටහන

| | | |
|---|---|---|
| • ජුනි මස 01 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම. |
| • ජුනි මස 15 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛ නිකුත් කිරීම. |
| • ජුනි මස 30 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු අයදුම් පත්‍ර කැඳවීම පිළිබඳ දැන්වීම නිකුත් කිරීම. |
| • ජූලි මස 31 දිනට පෙර | - | සේවා ස්ථාන ප්‍රධානීන් මගින් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම. |
| • අගෝස්තු 15 දිනට පෙර | - | හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාරදීම. |
| • අගෝස්තු මස 31 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත ලිඛිතව භාරදීම. |
| • සැප්තැම්බර් මස 15 දිනට පෙර | - | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම. |
| • සැප්තැම්බර් මස 15 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු පත් කිරීම. |
| • සැප්තැම්බර් මස 30 දිනට පෙර | - | ස්ථාන මාරු යෝජනා පිළිබඳ අභියාචනා, ස්ථාන මාරු සමාලෝචන කමිටු විසින් භාර ගැනීම. |
| • ඔක්තෝබර් මස 15 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත භාරදීම. |
| • නොවැම්බර් මස 01 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම. |
| • ජනවාරි මස 01 දිනට සිට | - | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. |

## 07. ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියමයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයෙහි අංක 16 පරිශිෂ්ඨයට ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තව ද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනා සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි ආයතන ප්‍රධාන හා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙතද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධාරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත් ඉදිරිපත් කළ හැක්කේය.

7.3 සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියමය අදාළ ස්ථාන මාරු නියෝගය ප්‍රසිද්ධියට පත්කරන ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙක් විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියළු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධාන, පත්කිරීම් බලධරයා හා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය. එසේවුවද වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාල ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ දෙසැම්බර් මස 01 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව රජයෙ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් හා ආයතන ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

02/05/2023

.............................................................

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා
නිරවුල් කිරීමේ නිලධාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.